# යුධවාදයට හා ගෝලීය ධනවාදයට එකඟ වෙමින් බඩුමිල හා දූෂණය ගැන කෑකෝ ගැසීම

මේ දවස්වල ප්‍රධාන ප්‍රශ්න දෙකකට හැමෝටම මුහුණ දෙන්න වෙලා තියෙනව.

එකක් තමයි තැන තැන ඇති වන බෝම්බ පිපිරීම්.

අනෙක් එක දැවැන්ත බඩුමිල ඉහළ යෑම.

මේ දෙකම යුද්ධයට සම්බන්ධ කාරණාවල්.

යුද්ධය පවත්වාගෙන යාම අවශ්‍යයයි කියල ආණ්ඩුව අවධාරණය කරනව. එහෙම නම් මේ අනතුරු දෙක ගැන කරන්න දෙයක් නෑ කියලයි ආණ්ඩුව කියන්නේ.

දැනට ඒ ගැන කරන්න පුළුවන් හැම දේම කරන නිසා යුද්ධය ගැන විවේචන නවත්වන්න කියලත් බල කරනව. කීත් නෝයර්ට කළ දේ හා යාපනයේ දේවරාජා මරණයෙන් පේනවා මේ බල කිරීමේ තරම කොච්චරද කියලත්.

**යූඇන්පීය යුද්ධය පවත්වාගෙන යන ගමන් ඊට අවශ්‍ය උදව්පදව් ඇමරිකාව ඇතුළු බලවතුන්ගෙන් ගන්න ඕන කියල තියෙනව. ඒ අතර බඩු මිල පාලනය කරන්න විවිධ උපා තියෙනව කියල කියනව" අනෙක් අතට දකුණේ සිදුවන පිපිරීම් ගැනත් ඒ වගේම අදහසක් කිව්වත් කොහොමද යුද්ධයක් කරගෙන යන ගමන් මේවා පාලනය කරන්නේ කියල කියන්නේ නැහැ.**

**.............මේ අනුව ගත්තහම මේ යූඇන්පී විවේචනය පරස්පර විරෝධයක්. ඒ අයට ගෝලීය බලවතුන්ගේ න්‍යාය පත්‍රයට විරුද්ධව යන්න පුළුවන් ගමනක් නැහැ කියල පෙනෙනව.**

මේ ගැන යූඇන්පී ය කියන්නේ එතරම් වෙනසක් ඇති කථාවක් නෙවෙයි. ඒ අයත් යුද්ධය පවත්වාගෙන යන්න ඕනෑ, ඒකට අවශ්‍ය උදව්පදව් ඇමරිකාව ඇතුළු බලවතුන්ගෙන් ගන්න ඕන කියලත් කියල තියෙනව. ඒත් ඒ අතර බඩු මිල පාලනය කරන්න විවිධ උපා තියෙනව කියල කියනව.

අනෙක් අතට දකුණේ සිදුවන පිපිරීම් ගැනත් ඒ වගේම අදහසක් කිව්වත් කොහොමද යුද්ධයක් කරගෙන යන ගමන් මේවා පාලනය කරන්නේ කියල කියන්නේ නැහැ. ඒ අතරම යුද්ධය විවේචනය කරන්න ඉඩ තියෙන්න ඕනෑ කියලත් කියනව. ඒ නිසා ආණ්ඩුව පැත්තෙන් ගෙනියන මාධ්‍ය මර්ධනය ගැනත් දැඩි විරෝධයක් දක්වනව.

මේ අනුව ගත්තහම මේ යූඇන්පී විවේචනය පරස්පර විරෝධයක්. ඒ අයට ගෝලීය බලවතුන්ගේ න්‍යාය පත්‍රයට විරුද්ධව යන්න පුළුවන් ගමනක් නැහැ කියල පෙනෙනව.

දකුණේ හැම තැනම වගේ කොටි සංවිධානයෙන් හෝ දෙමළ විමුක්ති සටනට සම්බන්ධ වෙන අයගෙන් වන බෝම්බ පිපිරීම් හා ඝාතන වාර්තා වෙන්න පටන් අරන්. බස් බෝම්බ, රේල්ලු බෝම්බ, සාප්පු බෝම්බ, මායිම් ගම්මානවල මරා දැමීම් ආදිය මෙයට ඇතුල් වෙනව.

අනුරාධපුරය අවටත්, වෙල්ලස්ස, කතරගම පැත්තෙත්, මිනිස්සු දැන් විශාල බියකින් ඉන්න බව පැහැදිලියි. ඒ කොටි හෝ අතුරු හමුදා කොටස් අවට කැලෑවල ඉන්න නිසා. ඒත් කොළඹ සාමාන්‍ය දෙමළ ජනතාව අතර හෝ සිංහල නගර තුළ හෝ සැඟවී සිටින සටන්කරුවන් ඉන්න බව පිළිගන්න වෙනව. මේක ටිකෙන් ටික මුළු රටම ගිල ගන්න තැනට ඇවිත්.

මේවා මර්ධනය කරන්න ආණ්ඩුව නිතරම පොරොන්දු වුණත් ඒක ලේසි වෙන්නේ නෑ. මොකද? දෙමළ විමුක්තිය වෙනුවෙන් සටන් වදින අය සාමාන්‍ය පුරවැසියන් අතර විශාල වශයෙන් ඉන්න නිසා. ආණ්ඩුවට බොහොම පක්ෂ බව පෙන්වමින් ජීවත් වන අතර යටින් මේ වගේ පහරදීම්වලට සම්බන්ධ වන අයත් බුරුතු පිටින් ඇති කියලයි මං නම් හිතන්නේ.

කොහොම වුණත් මේ අය අල්ල ගන්න ඉතාම අමාරු බව මෑත සිදුවීම්වලින් පෙනෙනව. දැනටමත් නිරන්තරයෙන් සිදුවන සෝදිසි මෙහෙයුම්, අත්අඩංගුවට ගැනීම්, මාර්ග බාධක ආදිය නිසා සිදු වන මානව අයිතිවාසිකම් විනාශය අති විශාලයි.

මීට අමතරව සුදු වෑන් වලින් පැමිණ උස්සගෙන යාම, තැන තැන සැක අය මරා දැමීම, මාධ්‍ය මර්ධනය, ඉතා ඉහළ මට්ටමක පවතින්නේ.

මේ අතර වැල්ලවත්තේ බෝම්බ ප්‍රහාරය එල්ල වෙලා තියෙන්නේ බස් එකකට නගින්න බලාගෙන හිටපු දෙමළ පිරිසකට. ඒ අනුව එය බස් හා රේල්ලු මගින් සිංහල වැසියන් මරා දැමීමට විරුද්ධව සිංහල ජාතිවාදී අතුරු හමුදා කණ්ඩායමක් හෝ පාතාල කණ්ඩායමක් කළා කියල හිතන්න පුළුවන්. එය ඉතාම පැහැදිලිව දෙමළ වැසියන්ට එල්ල වුණ පහරක්. මේ අනුව දෙමළ සිංහල එක එකා මරා ගැනීමේ වනචාරී ගැටුමක් ලෙසයි මෙය වර්ධනය වෙන්නේ.

උද්ධමනය යුද්ධය නිසා නොවෙයි ආණ්ඩුවේ බඩවඩා ගැනීම් නිසා සිදුවන දෙයක් ලෙස පෙන්වීමට යූඇන්පී ය මෙන්ම ජනතා විමුක්ති පෙරමුණත් උත්සාහ දරනව.

ඇමති මණ්ඩලය අඩු කළාම ප්‍රශ්නයෙන් බාගයක් විසඳෙනව කියලත් මේ අය කියනව. නාස්තිය, දූෂණය නිසා ඇති වන උද්ධමනය ගැනයි ඒ අය කියන්නේ.

**ආණ්ඩුව ගෙනියන යුධවාදී මෙන්ම ගෝලීය ධනවාදී ආර්ථික ප්‍රතිපත්තිවලට විරුද්ධ වෙන්නේ නැතිව නිකම් බඩුමිල ගැන නැත්නම් දූෂණය ගැන කෑකෝ ගැසීමෙන් පලක් නෑ.**

**රනිල් හා සෝමවංශ දෙපොලම ගෙනියන්නේ මේ වගේ පරස්පරවාදී ක්‍රියාමාර්ගයක්. මේ නිසා බැට කන ජනතාවට නැගී සිටීමට මාවතක් නෑ. එවන් මාවතක් හැදෙන්න ඕනෑ වාමාංශික පැත්තෙන්.**

ඇත්තටම ඔය කියන දේවල්වලින් උද්ධමනයේ ලොකු වෙනසක් ඇති කරන්න බෑ. මොකද? ලෝක බඩු මිල ඉහළ යාමට යන වැඩිපුර වියදමට අමතරව ලංකාවේ වන ලොකුම වියදම යුද්ධයයි.

යුද්ධයෙන් භාණ්ඩ නිෂ්පාදනයක් ඇති වෙන්නේ නෑ. ඒ නිසා එයට යන වියදම මේ උද්ධමනයෙන් විශාල කොටසකට වග කියනව.

උනෙක් අතට ගෝලීය බලවතුන්ගේ උපදෙස් අනුව ගෙන ගිය මහා පරිමාණ සංවර්ධනයත් උද්ධමනයම තමා සාමාන්‍ය ජනතාවට ලබා දෙන්නේ. ඒ පරිසර විනාශය, සම්ප්‍රදා විනාශය, නිජබිම් විනාශයට අමතරව.

මේ අනුව බඩුමිල ඉහළ යාමට මේ ඊනියා සංවර්ධනයත් බලපානව. ඒ අතරම මේ සංවර්ධනය තුළ ආහාර වගාවට නිසි බර වැටිල නෑ. මෙච්චර කල් දාලා තිබුණ වැඩසටහනින් ඒවා අවුල් වෙලා ගිහින්. ඒ නිසාත් මේ බඩු මිල ඉහළ යාම සිදු වෙලා තියෙනව.

මේ අනුව බැළුවහම ලෝක වෙළඳපොලේ බඩු මිල ඉහළ යාම මෙන්ම නාස්තිය, දූෂණයට, අමතරව මේ ගෙනියන ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසා ඇති වන උද්ධමනය විශාලයි. මේ ගැන යූඇන්පී නායකයින් නිහඬයි. මොකද? මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඒ ඇත්තෝ හදපු ප්‍රතිපත්ති නිසා. ආණ්ඩුවත්, යූඇන්පී යත් අතර යුද්ධය ගැන වෙනසක් තිබුණ නම් දන් ඒකත් ඉවර වෙලා.

ඇත්ත තමයි ආණ්ඩුව තුළත් ඉන්නව යුද්ධය නවත්වන්න කියන අය. යූඇන්පී ය තුළත් ඉන්නව එහෙම අය. ඒත් දෙගොල්ලොම ප්‍රතිපත්තිමය වශයෙන් ත්‍රස්තවාදය යුධමය වශයෙන් අතු ගා දැමීම පිළිගෙන ඉන්නේ. ඇමරිකාව හා ඉන්දියාවත් මේ අයට උපදෙස් දෙන්නේ යුද්ධය ගෙනියන්න. ඒ අතරම මානව හිමිකම් කඩවෙන දේවල් කරන්න එපා කියලත් කියනව.

ආණ්ඩුව ගෙනියන යුධවාදී මෙන්ම ගෝලීය ධනවාදී ආර්ථීක ප්‍රතිපත්තිවලට විරුද්ධ වෙන්නේ නැතිව නිකම් බඩුමිල ගැන නැත්නම් දූෂණය ගැන කෑකෝ ගැසීමෙන් පලක් නෑ.

රනිල් හා සෝමවංශ දෙපොලම ගෙනියන්නේ මේ වගේ පරස්පරවාදී ක්‍රියාමාර්ගයක්. මේ නිසා බැට කන ජනතාවට නැගී සිටීමට මාවතක් නෑ. එවන් මාවතක් හැදෙන්න ඕනෑ වාමාංශික පැත්තෙන්.

පසුගිය මැයි 1 දා වැඩ කරන ජනතාවගේ උවමනාවන් පෙන්වන එකතුවක් ඇති වුණා. ඒත් තවමත් ඒ එකතුවෙන් ඉදිරියට යන ගමනක් පෙන්නුම් කරන්න බැරි වෙලා තියෙනව. පහළ ජනතාවගෙන් තවම සද්දයක් නෑ කියල සමහර නායකයෝ කියනව. මේ වගේ වෙලාවක පහළ හඬක් එන්නේ ඉහළ ගැන බලල කියල මේ අය දන්නේ නැද්ද?